**RANAVIRU APPARELS**

---

## <u>රණවිරු ඇපරල් සේනාවිධායක බ්‍රිගේඩියර් එම්පීජ්එන්බි මහතුවක්කාර ආර්ඩබ්ලිව්පි ආර්එස්පි එන්ඩිසි විසින් නව සේනාවිධායක තනතුරේ වැඩ භාරගැනිම වෙනුවෙන් නිකුත් කරනු ලබන පණිවුඩය</u>

රණවිරු ඇපරල් ආයතනයේ හත්වන සේනාවිධායක වශයෙන් මා පත්කිරීම සබැඳිව වත්මන් යුද්ධ හමුදාධිපති තුමන් වෙත පළමුව ස්තූතිවන්ත වන අතර. ඔබ සැම වෙත පණිවුඩයක් සතිටුහන් කරනු ලබන්නේ ඉමහත් අභිමානයෙනි.

මෙතෙක් අප ආ ගමන් මග වර්ණවත් කිරීම උදෙසා විශාල කැප කිරීමක් සිදු කරන ලද යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මෙන්ම රණවිරු ඇපරල් කළමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩල සභාපති හා රණවිරු ඇපරල් කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කරන යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරිවරුන්, රණවිරු ඇපරල් කළමනාකරණ මණ්ඩලයේ හිටපු සභාපතිවරුන් ඇතුළු අධ්‍යක්ෂකවරුන්ද විශේෂයෙන් රණවිරු ඇපරල් සේනාවිධායක වරුන් ලෙස කටයුතු කල ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද, මේ අවස්ථාවේ ගෞරව පූර්වකව සිහිපත් කරමි. එමෙන්ම අප ආයතනයේ ආරම්භයේ සිට මේ දක්වා ස්වේච්ඡාවෙන් තම සේවා දායකත්වය සපයන රණවිරු ඇපරල් කළමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සිවිල් අධ්‍යක්‍ෂ මහත්ම මහත්මීන් හා නන් අයුරින් අප ආයතනයේ අභිවෘද්ධිය උදෙසා සහයෝගය ලබා දෙනු ලබන රජයේ සහ සිවිල් ආයතයන්හි සියලුම දෙනා හට මා මේ අවස්ථාවේ අප ආයතනයේ ගෞරව ප්‍රණාම පූර්වක කෘතඥතාව පුදකරමි.

යුද්ධ හමුදාවේ වාර්ෂික නිල ඇඳුම් අවශ්‍යතාවයෙන් 80% ක පමණ ප්‍රමාණයක් මේ වන විට නිෂ්පාදනය කරනු ලබන අප ආයතනය වසර 24 ක ඇඟලුම් ක්ෂේත්‍රයේ ලැබ තිබෙන පළපුරුද්ද, නව තාක්‍ෂණික දැනුම, සහ නිපුණත්වය තුලින් යුද්ධ හමුදාවට අයත් සියලු නිලඇඳුම් නිෂ්පාදනය කිරීමේ ඉලක්කය වෙත පහසුවෙන් ළඟාවිය හැකි ආත්ම විශ්වාසයක් අප සතුව පවතින බව පෙන්වා දෙමි. මෙම ඉලක්කය කරා ළඟා වීම සඳහා ඔබ සැමගේ උනන්දුව, කැපවීම සහ වගකීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණක් බැව් අවධාරණය කිරීමට කැමැත්තෙමි.

තවද අප ආයතනයේ සේවය කර අපගේ දියුණුව වෙනුවෙන් කැපවී දැනට වෙනත් ආයතන වෙත රාජකාරින් සඳහා ගොස් සිටින සහ විශ්‍රාම සුවයෙන් පසුවන සියලුම නිලධාරින් හා සෙසුනිලයන් ද මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. මීට අමතරව අප ආයතනය වෙත තම රණක්ෂිතභාවය මොහොතකට අමතක කර, ශ්‍රම දායකත්වය ලබා දෙන ඔබ සියලු දෙනාටත් ඔබගේ හිතාදරයින් හටත් මාගේ හද පිරි ප්‍රණාමය පුද කරනු ලබන අතර, මෙම ආයතනය වෙත අරෙසේ රාජකාරි සඳහා රපෝර්තු කර සිටින සහ ඉදුරාම මෙම ආයතන වෙත බඳවා ගන්නා ලද සෙබළ සෙබලියන්ට සහ මෙම ආයතනය හා සම්බන්ධ වි රාජකාරීන්හි නියැලී සිටින සියලුම සිවිල් සේවක මහතුන්ට හා ඔවුන්ගේ පවුල්වල අයවලුන්ට ද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

24 වසරක අභිමානවත් ගමනකට හිමිකම් කියන රණවිරු ඇපරල් ආයතනයේ නිලධාරින් හා සෙසුනිලයින් දැනුමෙන් හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ විනයගරුක හා වෘත්තීමය වශයෙන් ඉහළ තත්වයකට පත්කොට මෙම ආයතනයෙහි කීර්තිනාමය ඉදිරියටත් පවත්වාගෙන යාම අප සියලු දෙනාගේම පොදු වගකීමක් වන බව යළි යළිත් අවධාරණය කරන අතර, ඒ සඳහා ඇවැසි ශක්තිය සහ ධෛර්යය මෙන්ම ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයද නොඅඩුවම ලැබේවායි මා ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

එම්පීජ්එන්බි මහතුවක්කාර ආර්ඩබ්ලිව්පි ආර්එස්පි
බ්‍රිගේඩියර්
සේනාවිධායක

දිනය :- 2022 දෙසැම්බර් මස [illegible] දින